මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**PRE/2024/87**

**2024.09.17**

# ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

## විශ්වවිද්‍යාලවල කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු අයවළුන්ට, ඡන්ද විමසීම්වල දී වැටුප් හෝ පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2024.09.04 දිනැති අංක PRE/2024/65 දරන මාධ්‍ය නිවේදනය කෙරෙහි නැවතත් අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

මෙම ජනාධිපතිවරණ ඡන්ද විමසීමේ දී රාජ්‍ය විශ්වවිද්‍යාලවල කාර්ය මණ්ඩලවලට මෙන්ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද ඡන්දය ප්‍රකාශ කළ හැකිවන අයුරින් නිවාඩු ලබාදීමට ක්‍රියා කරන ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රධානීන් වෙත දන්වා ඇත.

ඒ අනුව රාජ්‍ය විශ්වවිද්‍යාල යටතට නොගැනෙන පෞද්ගලික විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින්ද ස්වකීය කාර්ය මණ්ඩල හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මෙම ඡන්ද විමසීමේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිවන පරිදි නිවාඩු ලබා දීමට ක්‍රියා කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)